**මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෘතිවල**

**සමාජ මානව විද්‍යාත්මක ලක්ෂණ.**

නවකතාකරු වනාහි මා හාත්පස ජීවිතය අවලෝකනය කොට එයින් කම්පිතව ඒ පිළිබඳව ස්වකීය ආකල්පය අන්‍යයන්ට සූචනය කිරීමේ අභිලාෂයෙන් නවකතා මාධ්‍යය තෝරා ගත්තෙකි' යි සුප්‍රකට ඉංග්‍රීසි නවකථාකරුවකු වන අර්නෝල්ඩ් බෙනට් සඳහන් කර ඇත. මෙසේ ජීවිතය පිළිබඳ අත්දැකීමක් ඔස්සේ තමා ජීවත්වෙන සමාජයේ වෙසෙන්නන් වෙත දයාද්‍ර හැඟීමකින් යුතුව එක්තරා අරුතක් කුළුගැන්වීමෙන් නවකතාකරුවා සමාජයට කරන්නේ විශාල මෙහෙවරකි. එයට හේතුව ජීවිතය, සමාජය, විශ්වය වැනි ගැඹුරු අංශ පිළිබඳව පිරිසිද බැලිය යුතු විඥානයක් ඇතැඹුලක් සේ පමණක් කරමින් සහෘද ජනකාය වෙත අපූර්ව අවබෝධයක් ලබා දෙමින්, ඔහු සමාජය දැනුවත් කිරීමය. යම් කලා කෘතියක්, එය බිහිවන ජීව පරිසරය හා අත්‍යන්තයෙන්ම බැඳී සම්බන්ධව පවතින බවත්, එය රස විඳිය හැක්කේ එම සීමා තුළ බවත්, එම කලා කෘතිය මැනවින් වටහා ගත හැක්කේ එය සතු සමාජ අර්ථයන් පසක් කර ගැනීමෙන් පණක් බවත්, ජෝ ඩිව් නම් ලේඛකයා පළ කර ඇත්තේ එහෙයිනි.

මාර්ටින් වික්‍රමසිංහ යනු මෑත යුගයේ ශ්‍රී ලාංකික ජනතාවගේ විඥාණය ගැඹුරින් පෝෂණය කළ දුලබ ගනයේ ප්‍රාඥයෙකි. ඉහත දැක්වූ ලෙස නවකතාකරුවෙකු විසින් කළ යුතු සමාජ මෙහෙවර යුග ගණනාවක් තිස්සේ අනලස්ව ඉටු කළ වියත් පඬිවරයෙකි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ප්‍රචලිතව ඇත්තේ සිංහලයේ මහාගත්කරුවා ලෙසයි. නවකථාකරුවෙකු ලෙස ඔහු සමකාලීන නවකථාකරුවන්ගෙන් වෙන්කොට සැලකිය හැක්කේ කවර නිසාද යන්න පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡාවකට භාජනය වී ඇත. එහෙත් වික්‍රමසිංහයන්, නවකතාකරුවෙක්ද? එසේ නැත්නම් නවකථාව මාධ්‍යකර ගත් සමාජ මානව විද්‍යා රචකයෙක් ද, සමාජ විද්‍යාවෙහි උප විෂය කොටසක් වන සංස්කෘතික මානව විද්‍යාවේ එන මූලික සිද්ධාන්ත විවිධ අංශයන්ගෙන් විවරණය කළ සංස්කෘතික මානව විද්‍යා රචකයෙක්ද? යන කරුණ තව දුරටත් අපගේ අවධානයට ලක් විය යුතුය. මෙම ලිපිය එය විමසා බලන්නකි.

වික්‍රමසිංහ මහතාගේ සමාජ මානව විද්‍යාත්මක චින්තනය අපට අංශ කීපයක් යටතේ පැහැදිලි කළ හැකිය. එනම්,

1. සමාජ වෙනස්වීම් පිළිබඳ දෘෂ්ටිය.
2. සමාජ සංවිධාන රටා පිළිබඳ දෘෂ්ටිය.

3. සමාජ හැසිරීම් පිළිබඳ දෘෂ්ටිය හා සමාජයෙහි දැකිය හැකි ජාතික චින්තනය පිළිබඳ දෘෂ්ටිය.
4. සංස්කෘතිය පිළිබඳ දෘෂ්ටිය වශයෙනි.

සමාජ වෙනස් වීම පිළිබඳව මාර්ටින් වික්‍රමසිංහයන් දීර්ඝ ලෙස විවරණය කරන්නේ ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය යන තුන් ඈඳුතු නවකතාව හා කළුවර ගෙදර නව කථාව තුළිනි. සමාජ පරිණාමය පිළිබඳ අර්ථවත් විශේෂිත දර්ශනයක් මෙම නවකථා තුළ ගැබ් වී පැවතීම එයට හේතුවයි. ගම්පෙරළියෙන් වැඩ වසම් ක්‍රමයේ බිඳ වැටීම හා නව ධනේශ්වර සමාජ ක්‍රමයේ ක්‍රමික පරිහානිය කියාපායි. යුගාන්තයෙන් එහි බිඳ වැටීම සහ අනාගතයේ ඇතිවන  නව ධනේශ්වර සමාජ  ක්‍රමයේ නැඟීම පෙන්නුම් කරන අතර කලියුගය තවදුරටත් එම නව ක්‍රමයේ ක්‍රමික පරිහානිය කියාපායි. යුගාන්තයෙන් එහි බිඳ වැටීම සහ අනාගතයේ ඇතිවන සමාජවාදී ක්‍රමය පිළිබඳ ඉඟියක් ලබා දෙයි. වික්‍රමසිංහයන් සමාජ පරිණාමයේ ප්‍රධාන හේතුව ලෙස දක්වන්නේ අර්ථ ක්‍රමයයි. ඔහු මවන චරිත, ඒවායේ මුවට නංවන අදහස්, හැඟීම් සියල්ල ම සමාජයේ මූලික ව්‍යූහය වන ආර්ථිකයේ රාව ප්‍රතිරාව වැන්න. එම ආර්ථික බලවේගය ක්‍රමාණුකූලව විනාශ වී  ගොස් ඒ තුළින් ගැඹුරු සමාජ ධර්මතාවන් මතු වී පෙනෙන  හැටියට වික්‍රමසිංහයන් සිය නවකථාවල චරිත හසුරුවයි. මෙම අදහස් කාල්මාක්ස් ඓතිහාසික භෞතික වාදය තුලින් ඉදිරිපත් කරන න්‍යායාත්මක අදහස් සමග බොහෝ දුරට ගැළපේ. නිෂ්පාදන බලවේගවල ඇතිවන වෙනස්කම් නිෂ්පාදන සබඳතාවල වෙනස්කම් වලට බලපායි. සමාජීය සබඳතා, නිෂ්පාදන සබඳතා හා සම්බන්ධවන නිසා අලුත් නිෂ්පාදන බලවේග ඇතිකර ගැනීමේදී සමාජය නිෂ්පාදන ක්‍රමය වෙනස් කරන අතර ඒ තුළින් ජීවන ක්‍රමය වෙනස් කිරීමත් මිනිසුන් ඔවුන්ගේ සමාජ සම්බන්ධතා ඒ අනුව වෙනස් කිරීමත්  සිදු වේ. ගම්පෙරළියේ තේමාව වන්නේ විසිවන සියවස මුල් භාගයේදී සිංහල ගැමි ජීවිතයේ සිදුවූ ප්‍රධාන වෙනස්කමකි. එනම් ගම පැරණි වැඩවසම් යුගයේ පැවති ආකාරයෙන් වෙනස් වී, විකාශනය වී නවීන ස්වරූපයක් ගත් ආකාරයත් ඉන් එහා පැවති සමාජක්‍රමය පුද්ගලයන් හා ගැමි පරිසරය වෙනස් වී ගිය ආකාරයත්ය. වැඩවසම් වාදයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කුල ස්ථරායනයයි. කයිසාරුවත්තේ මුහන්දිරම්, මාතර හාමිනේ, නන්දා අනුලා, ජිනදාස, කරෝලිස් ආදීන් මෙම ක්‍රමය පවත්වාගෙන යන්නවුන් ලෙස දක්වන කතුවරයා වැඩවසම් ක්‍රමය මූර්තිමත් කිරීමට හිරිගල, මහගෙදර ආදී සංකේතයන්ද ආශ්‍රය කර ගනී. කොග්ගල, රදලවාදයට හා ධනවාදයට මැදිව සිටී. අවසානයේ පැරණි රදල පංතියේ බිඳ වැටීම හා කලින් පහත් යයි සලකනු ලැබූ පෙළැන්තිය ආර්ථික අතින් රදළයන් අභිබවා නැඟී සිටී. වැඩවසම් ක්‍රමයේ දෙදරුම්කෑම හා ක්‍රමික පිරිහීම උද්දීපනය කිරීමට වික්‍රමසිංහ මහතා "හිරිගල" යොදා ගනී. සියවස් ගණනාවක් තිස්සේ අව්වට, වැස්සට නොසැලී නොවෙනස්ව හිස ඔසවා සිටින පහසුවන් විනාශ කළ නොහැකි දැඩි ප්‍රාග් ඓතිහාසික යුගයක සිට පැවත එන්නක් වුවද එහි විසිරුම් සංකේතවත් කරන්නේ අනාගතයේ ඇතිවිය හැකි විනාශයන්

පිළිබඳ පෙර ලකුණුය. වැඩවසම් ක්‍රමය බිඳ වැටී ගොඩ නැගුණු ධනවාදී යුගයද පුපුරා බිඳ හැලේ. මෙසේ ධනේෂ්වර සමාජ ක්‍රමය බිඳ දමා ඇති වන වන සමාජ ක්‍රමය පිළිබඳව වික්‍රමසිංහයන් කලියුගය නවකතාවේ පියල්ගේ මළ ගමින් පසුව මෙසේ සඳහන් කරයි.

"හිරමඬල, නැගෙනහිර අහස බලාගත් කළු වලා දවමින් පළවන්නට වෑයම් කරයි. එක් වලාවක් විපුලවමින් මතුවන හිරු මඬල තවත් වලාවකින් වැසෙයි. අඩ අඳුරු තිර පටක් පිටිපස දැල්වෙන පහනක දුබල එළිය ලෙස උදාගිර මුදුනට නගින්නට වෑයම් කරන ගිනිපෙත්ත හඳුනාගත හැකියි".

වික්‍රමසිහංයන්ගේ නව කථාවල සමාජ හැසිරීම් රටා විග්‍රහ වී ඇත්තේ සමාජයේ විද්‍යාමාන සිරිත් විරිත් හා ව්‍යවහාරයන් පාදක කර ගනිමිනි. තුන් ඈඳුතු නව කථා තුලින් සංස්කෘතීන් දෙකකට අයත් සිරිත් විරිත් ප්‍රකට වේ. එනම්, වැඩවසම් ජීවන ක්‍රමයක් පැවති ගැමි සමාජයේ සහ ධනවත් මධ්‍යම පංතික ජීවන රටාවත්, පැවැති නාගරික සමාජයේ ජීවන රටාවත් වශයෙනි. සිංහල අලුත් අවුරුද් එහි වළන් පොඩිවල ඉවීම, නම් චාරිත්‍රය, ගණුදෙණු කිරීම, මෙන්ම තොවිල් ශාන්ති කර්මය ආදිය ගැන ද ඒවා යටින් දිවෙන ගැමියාගේ හැසිරීම් රටාවද වික්‍රමසිංහ ඉතා ශූර ලෙස පෙන්වා ඇත.

"තොවිලයකට වුවමන දේ සැපයීම සඳහා පැමිණෙන ගැමියන්ගෙන්ද, ගැහැනුන්ගෙන්ද මහගෙදර පිරෙයි. එකෙකුට වුවද කළහැකි විලක්කු පන්දම් එතීමට හත් අට දෙනෙක් වෙහෙසෙති. කෙසෙල් ගස්, ගොක් අතු සැපයීමට හතර පස් දෙනෙක් යති.... තොවිලයට උවමනා දේ සැපයීමට වෙහෙසෙන මේ ගැමියෝ කුලී වයෙන් සතයකුදු නොගනිති...".

නාගරික මධ්‍යම පංතිකයන්ගේ හැසිරීම මීට වඩා හාත්පසින්ම වෙනස්ය. කලින් පහළ මධ්‍යම පංතියේ සිට ආර්ථික විශයෙන් සිදු වූ වර්ධනය හේතුකොටගෙන ඉහළ සමාජයට පිළිපන් ඔව්හු එම සමාජ රටාව අනුව හැඩගැසීමට මහත් වෙහෙසක් දරති.

"පියල් හා නන්දා ගම හැරදමා මීට අවුරුදු බොහෝ ගනණකට පෙර නගරයට සංක්‍රමණ වූහ. ඉහළ සමාජයේ ගැහැණුන් හා පිරිමින් ඇසුරු කරන්නට වූ නන්දා දැවුරුද්දක් පමණ ඉංග්‍රීසි බස උගත්තාය. ඈ ඉංග්‍රීසි උගත්තේ සමාජ වහරක් උගන්නා ලෙසිනි ".

වික්‍රමසිංහයන් ගේ නවකථා වලින් පිළිබිඹු වන තවත් සමාජ විද්‍යාත්මක ලක්ෂණයකි සමාජ සංවිධාන රටා. එනම් සමාජයේ ව්‍යුහය කෙසේ සකස් වී තිබුණා ද යන්නයි. තුන් ඈඳුතු

නවකථාව යටතේ  වැඩවසම් සමාජයේ ඉහළ හා පහළ වශයෙන් දෙකොටසක් වූහ. මේ ඉහළ පන්තියට අයත් වූවෝ ප්‍රභූන් හෙවත් රදළයන්ය. පහළ පංතියේ සිටියෝ ගොවීන් සහ අනෙක් සුලු රැකියා කරන්නවුන්ය. කොග්ගල දොන් ඇදිරියන් කයිසාරුවත්තේ මුහන්දිරම් ප්‍රධාන ඔහුගේ පවුලේ පුද්ගලයන් ප්‍රවේනි ගත රදළ සමාජයේ අනුභූතීන් විසින් තත් ජීවන රටාවක් ගැමි පරිසරයටත් සම්බන්ධ වූ කුලවාදය දේවත්වයෙන් අදහනු ලැබූ පිරිසකි. මෙම සමාජයේ දැකිය හැකි වන්නේ ඥාති හා කුල සංවිධාන රටාවන් ය. පවුලේ ඥාති සමූහයා ඕනෑම කටයුත්තකදී වැඩි වැදගත්කමකින් සැලකූ අයුරු පැහැදිලි වේ. මෙසේ බලතොත් වික්‍රමසිංහයන් තම නවකථා තුළින් සමාජ විද්‍යාත්මක ලක්ෂණ රැසක් ම ප්‍රකට කර ඇති බව පෙනේ.

මාර්ටින් වික්‍රසිංහයන් අගය කළ හැකි තවත් අංශයකි. ඔහුගේ සංස්කෘතික මානව විද්‍යාත්මක දායකත්වය.

මාර්ටින් වික්‍රමසිංහයන්ට අනුව මිනිසාගේ ආරම්භය වානර සතුන්ට සමාන වේ. සතුන්ගේ ක්‍රම විකාශය බලනවිට ඔවුනට ආවේනික යම් යම් ගති සිරිත් ලක්ෂණ රැසක් දක්නට ලැබේ. මිනිසාගේ යම් යම් බාහිර ලක්ෂණ රැසක්ම වානර වර්ගයාගේ යම් ගි පැවතුම් වලට නෑකම් කියන බව ඔහු ''වානරයා ගස් උඩ හැසිරෙන්නේ දෑත උස්සා අත්තෙන් අත්තට අල්ලමින් .... මිනිසා ඇවිදින්නේ දෑත පහත දමා ගෙනය. එහෙත් ඔහුගේ අතෙහි ලෝම උඩුකුරුව සිටින්නේ  ඔහු වානර වර්ගයාගේ සතකුගේ ක්‍රම විකාශයෙන් උපන්නෙකු බැවිණි''. ''මිනිස් ලේ හැඳින ගැනීමට සැදූ රසායන මිශ්‍රණයට අනිත් කිසිම සතෙකුගේ ලේ දැමූ විට විසිර මංඩි මෙන් පතුලට නොබසී. එහෙත් චිම්පන්සියා, ගෝරිල්ලා ආදී මහා වානරයෙකුගේ ලේ බිඳක් ඒ මිශ්‍රණයට දැමූ විට මිනිස් ලේ මෙන් විසිර මංඩි බසියි. ලෙයින් මිනිසාත් වානරයාත් ළඟම නෑකම් ඇත්තන් බව මෙයින් හෙළි වෙයි''. මෙම අදහස මානව පරිණාමය පිළිබඳ අලුත් අදහසකි. මෙසේ මානව වර්ගයාගේ පරිණාමය පිළිබඳව සිංහල මාධ්‍යයෙන් රචිත ප්‍රථම පර්යේෂණාත්මක කෘතිය වශයෙන් සත්ව සන්තතිය මානව විද්‍යාත්මක අගයෙන් අනූන කෘතියක් බැව් පෙනේ. ''මානව විද්‍යාවේ ප්‍රධාන කොටසක් වන භෞතික මානව විද්‍යාවේ ඇතැම් කරුණු ආශ්‍රයෙන් ලියා ඇති සත්ව සන්තතියෙන් සත්ව පරිණාමය, මානව පරිණාමය පුරා සත්ව විද්‍යා පුරා විද්‍යාව පිළිබඳව විද්‍යාත්මක කරුණු සිංහල පාඨකයාට දැනගත හැකිය."

සංස්කෘතිය පිළිබඳව මානව විද්‍යාඥයින් විසින් කරනු ලැබ ඇති විමර්ශනයන් සංස්කෘතික මානව විද්‍යාවේදී කියැවීමට ලැබේ. මාර්ටින් වික්‍රමසිංහ මහතා සංස්කෘතිය හා සිංහල සංස්කෘතිය පිළිබඳව සිංහලෙන් ඉදිරිපත් කර ඇති විග්‍රහයන් මානව විද්‍යාඥයන් විසින් මින් පෙර ඉදිරිපත් කරනු ලැබූ එම සම්භාව්‍ය මතාන්තර සිහිපත් කරවයි.

''සංස්කෘතිය, සමහරු ගුණ වගාව නමින්ද, සමහරු ආගම ඉගැන්වීමෙන් හා සාහිත්‍ය කලාස්වාදයෙන් ලැබෙන "චිත්ත විශුද්ධිය'' නමින්ද හඳුන්වති''.... මේ විවරණ දෙකින්ම අදහස් කෙරෙන දේ සංස්කෘතියෙහි එක් අංගයක් පමණි. සංස්කෘතිය යන පදයෙන් හැඳින්වෙන සියලුම දේ ඊට හසුවන්නේ නැත''.

මෙය සංස්කෘතිය පිළිබඳව පුළුල් ප්‍රකාශයකි. එහෙත් සිංහල පමනක් උගත් පාඨකයාට සංස්කෘතිය පිළිබඳව විස්තරාත්මකව සොයා බලන්නට මිත් දිරි ගැන්වීමක් කරනු ලබයි සංස්කෘතිය තනිකරම භෞතික හා අභෞතික දෙයක් නොවන බවත් ඒ දෙකෙහිම සංකලනය එයට ඇතුලු වන බවක් වික්‍රමසිංහයන් උදාහරණ සහිතව පැහැදිලි කරයි.

"මනුෂ්‍යයන් සමූහයක්, තලයක් වර්ගයක් වශයෙන් ජීවත් වන්නේ ඔවුන් ජීවත් වන අනික් සතුන් මෙන් මනුෂ්‍ය පරිසරයහි ප්‍රකෘතියෙහි වහලෙකු නොවේ. ඔහු පරිසරය වෙනස් කරමින් ප්‍රකෘතිය වහලෙකු කර ගැනීමට වෑයම් කරන්නේ තමා විසින් නිපදවන උපකරණ නොහොත් අවි භාවිතා කිරීමෙනි. මානව විද්‍යාව මේ උපකරණ සංස්කෘතික උපකරණ ලෙස සලකති. මේ උකරණ භාවිතය නිසා සංස්කෘතිය ඇති වේ".

මෙම හැඳින්වීම් සංස්කෘතිය පිළිබඳ පෘථුල හැඳින්වීමකි. මිනිසා සමූහයක හැටියට නොව සමාජයක් හැටියට සංවිධාන වීමත් සමග සංස්කෘතියක් යැයි හඳුනාගත හැකි ධර්තාවලියක් හා ක්‍රියාකාරකම් පද්ධතියක් පහළ වූයේය. යන්න මානව විද්‍යාවේ පිලිගෙන ඇති අදහසකි. සමාජයක ජීවත්වන මිනිසා හැමවිටම කරන්නේ තමා අවට ඇති පරිසරය වෙනස් කිරීමයි. තමාගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමේදී ඔහුට පරිසරය හා විවිධ ලෙස ගැටෙන්නට සිදුවීම එයට හේතුවයි. මෙහිදී ඔහු යම් යම් උපකරණ ආම්පන්න ආදියද සාදා ගනී. එවැනි දෑ සංස්කෘතියෙහි කොටසක්ව භෞතික සංස්කෘතිය බවත් එම උපකරණ භාවිතා කරන පොදු රටාව හා ඒ ඔස්සේ හට ගත් හැසිරීම් රටාව මානසික සංස්කෘතිය බවත්, ක්‍රෝබර් සහ ක්ලක් හෝර්න් යන මානව විද්‍යාඥයන් දෙදෙනා ද පවසා ඇත.

මාර්ටින් වික්‍රමසිංහ මහතාට අනුව යම් රට ජනතාවගේ ප්‍රධාන ආහාරය නිපදවීමට දරනු ලබන සාමූහික උත්සාහය සංස්කෘතිය තේරුම් ගැනීම ඉතාමත්ම වැදගත් වේ. ඒ අනුව ශිෂ්ටාචාරයන්ගේ උපත සිදු වේ. ඉරිඟු සභ්‍යත්වය, තිරිඟු සභ්‍යත්වය බටහිර ලෝකයේ පැන නැගුණ බව පැහැදිලි කරන වික්‍රමසිංහයන් ලංකාවේ දැකිය හැක්කේ සහල් සභ්‍යත්වයක් බැව් කියයි. ලංකාවේ පවතින මෙම සහල් සභ්‍යත්වය වැව් තැනීම මත පදනම් වූවකි. එම වැව් තැනිය හැක්කේ පවුලක්, කුලයක් හා අපේක්ෂාවකින් එකට බැඳුණු ජනතාවක් විසිනි.

මේ නිසා වැව හා වී ගොවිතැන අපේම යයි කිව හැකි අදීන සිංහල සස්කෘතිය පෙන්නුම් කරන මූලිකාංග වෙතැයි මාර්ටින් වික්‍රමසිංහයෝ පැහැදිලි කරති.

"අදීන සිංහල සංස්කෘතියක පටන් ගැනීමට හේතුවුනු මුල් බිජුවට මෙහි සිටුවන ලද්දේ විජය විසින් නොව පළමුවන වැව සෑදවූ පණ්ඩුකාභය විසිනි''.

"සිංහල සංස්කෘතියේ ශ්‍රේෂ්ඨතම අංගය ලෙස සැලකිය හැක්කේ වැව්ය''. මෙයින් පෙනී යන වැදගත් කරුණක් නම්, සංස්කෘතිය, නිර්මාණය වීම, සංස්කෘතිය පවත්වා ගෙන යෑම, ආදී අංශ පිළිබඳව වික්‍රමසිංහයන්ගේ දෘෂ්ටිය සමාජ විද්‍යාත්මක එකක් බවයි. සිංහලයේ දක්නට ලැබෙන බොහෝ ජනකථා විශ්වාස, ජනකවි ආදියෙන් සුසැඳුණු ජන සාහිත්‍යය පිළිබඳවද වික්‍රමසිංහයන් පවසන්නේ ඒවාද අපේ සහල් සභ්‍යත්වයේ කේන්ද්‍රීය අංශය වන වී ගොවිතැන පසුබිම් කොටගෙන ඇති බවයි. "වැව් කර්මාන්තයත්, වැව් වලින් ලත් ජලයෙන් කරන ලද ගොවිතැනුත් නිසා උපන් ජන කථා හා දේව කථාද ප්‍රස්ථා පිරුළුද අපේ සස්කෘතියෙහි අදීනත්වය කියන නිසැක සලකුණුය".

සිංහල සංස්කෘතියෙහි හැඩගැසීම කෙරෙහි වැව් කර්මාන්තය මෙන්ම බුදු සමයේ බලපෑමක් ලැබී ඇති බව ප්‍රකට කරුණකි. මාර්ටින් වික්‍රමසිංහයන්එම ප්‍රකට අදහස ඉදිරිපත් කරන්නේද එක්තරා සමාජ විද්‍යාත්මක දෘෂ්ටියකිනි. ඔහුට අනුව බුදු සමය සිංහල ජාතියට සම්බන්ධ වූයේද සිංහලයාගේ ජීවනෝපාය වූ වී ගොවිතැන ආශ්‍රයෙනි. බුදු සමය විසින් කෘෂිකර්මය අගයනු ලැබුවා පමණක් නොව භික්ෂූන් වහන්සේලාගේ සිවුර සකස් කිරීමේදී පවා ලියදි ආකාරයට එය සකස් කර ගත යුතු යයි බුදුන් වහන්සේ දේශනා කර ඇත. වැවයි දාගැබයි යන ප්‍රචලිත සංකේත, භෞතික සංස්කෘතය හොබවන දියුණුවක්, මානසික සංස්කෘතිය හොබවන මානසික දියුණුවත් එකට එක්තැන් කිරීමකි. අනෙක් අතට දාගැබ් නිර්මාණය පිළිබඳව බලන විට එහිදී ද වී ගොවිතැනේ ආභාසය ජාතියට ලැබී ඇතැයි ඔහු දක්වයි. දාගැබ නිර්මාණය කිරීම ක්‍රම සයකින් දක්නට ලැබුනද ලංකාවේ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන බුබ්බුලාකාර,ඝන්ටාකාර හා ධාන්‍යාකාර යන ක්‍රම තුනම වී ගොවිතැනට හා ජලයට සම්බන්ධය, දිය බුබුලකින් අනිතය භාවය මෙන්ම, ජලයේ ඇති වැදගත්කමද පෙන්වා දේ. ඝණ්ටාකාර දාගැබ් ඝණ්ටාරය හැඩය ගනී. ඝණ්ටාරයෙන් සංකේතය වනුයේ වේලාව දැන ගැනීමේ ක්‍රමයක් විය හැකිය. දහවල බුද්ධ පූජාවට නාද කරනු ලබන ඝණ්ටාව කුඹුරේ වැඩ කරන ගැමියන්ට වෙලාව දැන ගැනීමට උපකාර වෙයි. ධාන්‍යාකාර දා ගැබ ගොඩ ගැසූ ධාන්‍ය ගොඩක සවරූපය ගනී.

මෙසේ සිංහල සංස්කෘතිය වැව කේන්ද්‍ර කරගත් වැවෙන් උපන් සංස්කෘතිය ලෙස, වික්‍රමසිංයන්ගේ හැඳින්වීම, තුළ මානව විද්‍යාත්මක පමණක්නොව සමාජ විද්‍යාත්මක වැදගත්කමක්ද ගැබ්ව පවතින බවක් පෙනේ.

සංස්කෘතික මානව විද්‍යාවේදී නරන්තරයෙන් සාකච්ජා කෙරෙන තවත් අංශ දෙකකි. සංස්කෘතික සම්පර්කය, සහ සංස්කෘතික විසරණය. සංස්කෘතික සම්පර්කය හා සංස්කෘතික විසරණය යන්නෙන් පොදුවේ අදහස් කෙරෙන්නේ කිසියම් සංස්කෘතියක් තවත් සංස්කෘතියක අංග ලක්‍ෂණ සම්බන්ධ වීමෙන් මුල් සංස්කෘතියේ ඇතිවන වෙනස්වීම්හා ව්‍යාප්තියයි. මාර්ටින් වික්‍රමසිංහයන් මෙම අංශ දෙකම සිංහල සංස්කෘතිය පදනම් කොට දීර්ඝ වශයෙන් සාකච්ජා කර ඇත. විශේෂයෙන්ම ලංකාවේ සංස්කෘතියේ යම් යම් අංග හැඩ ගැසීමට ඉන්දියාවේ බලපෑම ලැබුනේය යන ප්‍රචලිත මතය මුලුමනින්ම පිළි ගැනීමට ඔහු සූදානම් නොවෙයි. ඔහු පෙන්වා දෙන්නේ ඉන්දියාවට වඩා මැලනීසියාව,පොලිනීසියාව, වැනි පැරණි ගෝත්‍රික සමාජවලින් යම් සංස්කෘතික අංශ අපේ සංස්කෘතියට බලපා ඇති බවයි.

ඉන්දියාවේ ජනයාගෙන් ගත් දේ පමණක් නොව ශාන්තිකර සාගරයේ මිලේච්ජ මනුෂ්‍යයන් විසින් ප්‍රවේශ කරන ලදැයි කිව හැකිදේ අපේ සංස්කෘතියෙහි වෙයි. පොලිනිසියාව, මැලනීසියාව, ආදී ශාන්තිකර කොදෙව්වල ජනයා අතර පවතින සිරිත් විරිත් විශ්වාස උපකරණ අදියට සරිලන සිරිත් විරිත් විශ්වාස උපකරණ ආදිය අප අතර දක්නා ලැබේ.

මේ සඳහා වික්‍රමසිංහ මහතා නගා මැරූ අලයේ කථාව යයි සිංහලයන් අතර ප්‍රචලිත කථාව ගෙනහැර දක්වයි. ''තවද ලංකාවේ දකුණු පලාතේ ජනයා අතර මල් බලිය හා අන්තගත මැතිරීම නමින් හැඳින්වෙන තොවිලයක් වෙයි. කෙසෙල් කඳක් කපා එයින් සාදන මල් බලිය ගොක් කොලවලින් සරසනු ලැබේ...ඒ මල් බලිය ලෙඩා ඉදිරියේ තබා යකැදුරා, කවි ද, මන්තර ද මතුරයි''.

''...අපේ මේ අත්තගහ මැතිරීමට අසමාන නොවන තොවිලයක් නිව්ගිනියාවේ මිලේච්ජයන් අතර පැවැත්නේය. සර් ජේ.පී.ප්‍රේසර් ඒ තොවිලය විස්තර කරන්නේ මෙසේය.

"ලෙඩට හේතුව කොඩි විනයකි. නොඑසේනම් භූතාවේෂයකැයි ඔව්හු විශ්වාස කරති. ඔවුන්ගේ යක්දෙස්සෝ කැලයට ගොස් කොල වර්ග කීපයක් කඩා ගෙනැවිත් ඒ කොළ ගින්නෙන් තවති''

නගා මැරූ අලයේ කථා වස්තුව අනුව සොහොයුරෙක් සහ සොහොයුරියක් වනයේ ඇවිද යද්දි සොහොයුරා සිය කඩුවේ තුඩින් හුණු ටිකක් සිය සොහොයුරියට දෙයි. ඒ සමගම ඇගේ කාම රාගයද උත්සන්නවේ. මෙයින් කෝපයට පත් සොහොයුරා සිය නැගනිය මරා දමයි. අවසානයේදී ඔහුට පෙනී ගියේ තම කඩුව බිම ඇන තිබූ තැන යටවී තිබූ අලවර්ගයක් නිසා ඇගේ කාමාග්නිය ඇති වූ බවයි. මේ කථාව පදනම් කොට වික්‍රමසිංහ මහතා ඉතා වැදගත් සංස්කෘතික විග්‍රහයක යෙදේ. පළමුකොට මීට සමාන කථාවක් ශාන්තිකර කොදෙව් දූවේ. වනචාරින් අතර ඇතැයි කියන මැලනවුස්කි නම් මානව විද්‍යාඥයාගේ සොයා ගැනීම් ඔහු විමසා බලයි. එහිදී ඔහු දකින්නේ එම සමාජය මාතෘමූලික-පවුලේ සහෝදර සහෝදරියන් ලෙස වෙන් වෙන්ව වැඩෙන තත්ත්වයක පවතින එකක් බවයි. එබඳු තත්ත්වයක් ඇති කර ඇත්තේ ඔවුන් අතර ලිංගික සබඳකම් ඇතිවීමෙන් සිදුවන භයානක විපත වැලැක්වීමටය. එසේ නම් එම කථාව එහි උපත ලබා එයට වඩා වෙනස් මුහුණුවරින් ලංකාවේ සංස්කෘතික පරිසරයට අනුකූලව මෙහි භාවිත වන්නට ඇතැයි වික්‍රමසිංහයෝ තර්ක කරති.

මේ හැර ලංකාවේ කුඩා ළමුන් විසින් ලණු දෙපටකින් පොල් කටු දෙකක් බැඳ ඒ මත දෙපා තබමින් ඇවිදින සෙල්ලමක් ගැන තවත් මානව විද්‍යාවරියක් වන මාග්‍රට්මීඩ්ගේ ග්‍රන්ථයක ඇතැයිද, සොරකම් කළ අය අල්ලා ගැනීම සඳහා කරනු ලබන පොල් කැරකවීම් මන්ත්‍ර ගුරුකම පොලිනිසියාවේ ජනයා අතර ඇතැයිද පෙන්වා දෙයි. සංස්කෘතික විසරණය පිළිබඳ මෙම අදහස් මුලුමනින්ම පිළිගත නොහැකි වුවද ඒවායෙහි එක්තරා වැදගත් කමක් රදා පවතින්නේ පළමුවරට සංස්කෘතික මානව විද්‍යාඥයින්ගේ සංකල්ප අපේ සංස්කෘතිය තේරුම් ගැනීමට යොදාගත් ප්‍රථම අවස්ථාව මෙය වීම නිසයි. සිංහල ජාතිය සාමය ප්‍රිය කරන ආචාරශීලී ජාතියක්ය යන වික්‍රමසිංහයන්ගේ නිගමනය ද බැලූ බැල්මට පුළුල් එකකි. ඇතැම් තැන්වල සිංහලයන් වැඩි දෙනෙක් සාමකාමී යැයි දක්වා ඇත. මෙවැනි නිගමන කරා එළඹීමට වික්‍රමසිංහයන් පෙළඹී ඇත්තේ ඔහු විසින් තනාගත් යම් උපකල්පනයක් මගිනි. එනම් බුදු සමයේ ඍජු බලපෑම සිංහලයන්ට ලැබේය යන්නයි. මේ මතය සනාථ කිරීම සඳහා 1956-බෞද්ධ තොරතුරු පරීක්ෂණය සභාවේ වාර්තාවේ කොටසක්ද ඔහු උපුටා දක්වා ඇත.

''මෙරට සිදුවන අපරාධ ගණන දිනෙන් දිනම වැඩිවීම සංවේගයට කාරණයකි. මෙහි වාසය කරන අසූ ලක්ෂයක් පමණ ජනයාගෙන් පනස් තුන් ලක්ෂයක් පමණ බෞද්ධ ජනයා වෙයි. බෞද්ධයන්ගේ ගණන වැඩිවූ නිසාම අපරාධ ගැන දොස් ලැබෙන්නේ ඔවුන්ට මය. මේ දොෂාරෝපණ යුක්ති සහගත නොවන බව කිව යුතුය. ඒ ඒ ආගමික පක්ෂ වල ජන සංඛ්‍යාව හා අපරාධ ගණන සන්සන්දනය කළවිට පෙනී යන්නේ බෞද්ධයන් අන්‍ය ආගමික පක්ෂයන් තරම් අපරාධකාරී නොවන බවය''.

මෙය විවාදාත්මක කරුණකි. අනෙක් අතට ආදර්ශ සමාජයක ආකෘතියක් ලෙස පොලිනිසියානු සමාජය පිළිගත හැකිද යන ප්‍රශ්නයද පසුකාලයේදි මතු වී ඇත.

සංස්කෘතියේ වෙනස්වීම පිළිබඳව කථා කිරීමේදී වික්‍රමසිංහයන් සිංහල සංස්කෘතිය උදාහරණට ගෙන ඉදිරිපත් කර ඇති කරුණුද මානව විද්‍යාත්මක එළඹුමකින් යුතුව ඉදිරිපත් කිරීමට උනන්දුවී ඇත. ඔහු තමාගේ බුදු සමය හා සමාජ දර්ශනය නම් කෘතියෙහි සංස්කෘතික වෙනස්වීම් කෙරෙහි බලපාන ප්‍රධාන කරුණු තුනක් ගැන කරුණු දක්වයි. එනම්,

1. එකිනෙකට වෙනස් වූ සංස්කෘතින් පවතින සමාජ දෙකක් අතර ඇතිවන සම්බන්ධය නිසා එම සංස්කෘතීන් දෙකම වෙනස්වීම.
2. ස්වභාවික පරිසරයෙන් සිදුවන වෙනස්වීම් හෝ වෙනත් සංක්‍රමණ හා ආක්‍රමණ නිසා සංස්කෘතියේ වෙනස්වීම
3. යම් යම් නව තාක්ෂණික උපකරණ හා ක්‍රම උපායයන් හෝ භාවිතය කරණ කොට සංස්කෘතිය පරිමාණාත්මකව වෙනස්වීම.

   යනුවෙනි. මෙම න්‍යායාත්මක ආකෘතිය පදනම් කරගෙන ඔහු සිංහලයාගේ සංස්කෘතියේ ඇතිවූ වෙනස්වීම් කවරේදැයි සාකච්ඡා කර ඇත. සිංහල සස්කෘතියේ වෙනස්වීම් සිදු වූ ප්‍රධාන අවධීන් කවරේදැයි වික්‍රමසිංහයන් මෙසේ සාරාංශ කර දක්වා ඇත.

පළමු අවධිය ඃ

ප්‍රථම වැව කැනීමත් සමග ඇරඹේ. එය අභය වැව නම වේ. එමගින් සංස්කෘතිය එල දැරීමට අවශ්‍ය බජ රෝපණය විණ.

දෙවන අවධිය ඃ

මහායාන බුදු දහමේ පැමිණීමත් සමග ඇරඹේ.

තෙවන අවධියඃ

බටහිර ජාතීන්ගේ පැමිණීමත් සමග ඇරඹේ.

මෙසේ මාර්ටින් වික්‍රමසිංහයෝ සිංහල සංස්කෘතියේ වෙනස්වීම යුගයෙන් යුගය ක්‍රමානුකූලව සිදුවූ ආකාරය හඳුනා ගනිති. එහි අවසාන අවස්ථාව ලෙස පෙන්වා දුන් බටහිර ජාතීන්ගේ සංක්‍රමණය හේතුවෙන් සිංහලයාගේ චින්තනය, පරිකල්පනය හා අචාරවිචාර සියල්ලම වෙනස්වී යයි. එහෙත් මේ වෙනස්කම් යාපනේ ජනයාගේ සංස්කෘතියෙහි සිදු

නොවෙයි. එකම රටක දෙතැනක දැකිය හැකි මේ තත්වය පිළිබඳව ද වික්‍රමසිංහයන් හෙලා ඇත්තේ මානව විද්‍යාත්මක දෘෂ්ටියකි.

"යාපනයේ ජනයා සිංහලයන් තරම් ඉක්මනින් බටහිර සභ්‍යත්වයට ගොදුරු නොවූහ. බටහිර භාෂා ශාස්ත්‍ර උගත් යාපනේ ජනයා තමන්ගේ ඇතැම් ජාතික සිරිත් විරිත් හා ඇඳුම් පැලඳුම් සම්පූර්ණයෙන්ම බැහැර නොකළේ ඔවුන් සජාතීය අංගයන්ගෙන් සැදුණු සංස්කෘතියක් විසින් තරයේ බඳිනු ලැබූ ජනකායක් වූ බැවිනි......"

මෙයින් ඔහු අවධාරණය කරන්නේ හින්දු ආගම ආත්ම වාදයක් බැවින් ආත්ම වාදආශ්‍රයෙන් දියුණු වූ ද්‍රවිඩ සංස්කෘතියේ හැම අංගයක්ම, ආත්ම වාදයක් වන හින්දු දහම විසින් රකිනු ලැබූ බවයි. එහෙත් සිංහල සංස්කෘතිය පිළිබඳ දැකිය හැක්කේ මෙයට වඩා වෙනස් තත්වයකි. අපේ සංස්කෘතියේ ආවේණික හරයන්ට අසමාන හෙවත් බින්න අංග ඉන්දියාවේ හින්දු බලපෑම ලබා බාහිර අලංකරණසේ ප්‍රකටව පැවතිණ. ප්‍රකටව පෙනෙන මෙම බින්න අංගයන් මහත් කොට සැලකූ සමහරුන් සිංහල සංස්කෘතිය හින්දු සංස්කෘතියේම ශාඛාවක් යැයි තීරණය කළහ. (එහෙත් සිංහල සංස්කෘතියෙහි නියම සජාතීය අංගයන් ලෙස සැලකිය යුත්තේ වැව් වහල් කොට ගෙන කරන ලද ගොවිතැන, ඒ ගොවිකම් සඳහා වහල් වුණු උපකරණ, ගොවීන් හා ගොවිකම නිසා උපන් සිරිත්, කථා වස්තු යනාදියත් බුදුසමය මුල් කරගෙන උපන් හෝ බුදුසමය විසින් සකස් කළ ආචාර සමාචාර විධි ප්‍රතිමා චිත්‍ර කලා, කථා වස්තු වත් පිළිවෙත් පමණි.) කෙසේ වුවද අපට නොගැළපෙන මෙම භින්න අංගයන් දෙදරවන තරම් විප්ලවයකි, බටහිර ජාතින්ගේ පැමිනීමත් සමග සිදුවූයේ. එසේ නම් සිංහලයන් තමන්ගේ ජාතික සිරිත් විරිත් ඉවත දැමීමෙහි ශූරයන් වූහයි සමහරුන් කියන්නේ ඔවුනට නින්දා කරන අටියෙනැයි මාර්ටින් වික්‍රමසිංහයෝ පෙන්වා දෙති.

"..... එය ඔවුන්ගේ එක්තරා දුබලකමක් කියන ලකුණක් පමණක් නොව ඔවුන්ගේ ආදීනත්වය කියන ලකුණක්ද වෙයියම කිසි ජනතාවක් ඒ අදීනත්වය ලැබිය යුත්තේ ජාතියේ චිරස්ථිතියට හේතුවන දෙයක් වන්දියක් වශයෙන් ගෙවීමෙනි. සිංහලයන් සුඛනම්‍ය මනසක් ඇති ජාතියක් ලෙස රැකුනේ ඒ වන්දිය ගෙවූ බැවිනි. ඒ වන්දි ගෙවාතමන්ගේ අදීනත්වයත් සුඛනම්‍ය මනසත් රැක ගැනීමට ඔවුනට අනුබල දුන්නේ බුදු සමය ය".

මෙම අදහස් තුළින් ද පෙනී යන්නේ සංස්කෘතියේ වෙනස්වීම පිළිබඳව වික්‍රමසිංහයන්ගේ විග්‍රහය මානව විද්‍යාත්මක මූලයන් සහිත එකක්ම බවයි. ආගම සහ ජාතිය එකට බැඳී ඇතැ'යි යන ප්‍රචලිත ජනප්‍රිය අදහස පවා වික්‍රමසිංහයන් පවසන්නේ පැහැදිලි අර්ථයක් ඇතිවයි. අනෙක් අතට ඔහු සංස්කෘතීන්ගේ වෙනස්වීම පිළිබඳ පොදු අදහස

තුලනාත්මක පිරික්සුමට ලක් කර ඇත. මානව විද්‍යාවේ තුලනාත්මක ක්‍රමවේදය යනුවෙන් හැඳින්වෙන්නේ ද මෙහිම පරිණත මට්ටමකට ළඟා වූ උසස් විධි ක්‍රමයකි.

සාකච්ජාව

මානව විද්‍යාවේ සඳහන් යම් යම් මූලික සංකල්ප, රැසක් අධ්‍යයනය කිරීම සඳහා මාර්ටින් වික්‍රමසිංහයන්ගේ දායකත්වය ඉතා වැදගත් බව පොදුවේ පිළිගත යුතුය. මෙම ලිපිය ආරම්භයේ දී පෙන්වාදුන් පරිදි මානව විද්‍යාව පිළිබඳ කිසිදු අවබෝධයක් හා ප්‍රසිද්ධියක් නොතිබූ සමයෙක ඒ පිළිබඳව සිංහලෙන් පොතපත ලියා පළ කිරීමෙන් මෙරටේ මානව විද්‍යා ප්‍රබෝධයට වික්‍රමසිංහයන් පුරෝගාමී වූයේ යැයි කිව හැක. සංස්කෘතික මානව විද්‍යාව පිළිබඳ වැදගත් කරුණු මුල් වරට සිංහල පාඨකයන්ට හඳුන්වා දුන් ඔහුගේ ප්‍රධානතම ශාස්ත්‍රිය කෘතිවන.

සත්ව සන්තතිය (පළමු මුද්‍රණය) - 1934

පුරාණ සිංහල ස්ත්‍රීන්ගේ ඇඳුම - 1947

සිංහල ලකුණ පළමු මුද්‍රණය - 1948

බුදු සමය හා සමාජ දර්ශනය (පළමු මුද්‍රණය)- 1948

යන කෘති ලියවුණ කාලයේ දි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය තුළ මානව විද්‍යාව හෝ සමාජ විද්‍යාව, ස්වාධීන විෂයයයන් ලෙස ආරම්භ වී නොතිබිණි. මෙබඳු වාතාවරණයක් යටතේ මාර්ටින් වික්‍රමසිංහයන් තත් ක්ෂේත්‍රය පිළිබඳව සංවාදශීලී විවරණ ඉදිරිපත් කළා පමණක් නොව, විශ්වවිද්‍යාල මට්ටමින් මානව විද්‍යාව ඉගැන්වීමේ අංශයක් ආරම්භ කළ යුතු යැයි ද උද්ඝෝෂණය කළේය. වික්‍රමසිංහයන් විසින් මානව විද්‍යාව පිළිබඳව ලියූ යට දක්වන ලද ප්‍රධාන ග්‍රන්ථ හා ලිපි ලේඛන වල එන කරුණු කෙටිකර ඉදිරිපත් කළ මානව විද්‍යාව හා සංස්කෘතිය (1974) යන කෘතිය නිකුත් වන විට මානව විද්‍යාව පිළිබඳ සිංහල පාඨකයාට කියවීමට තිබුණේ සීමිත පරිවර්තන කීපයක් පමණක් බව මෙහිදී අවධාරණය කළ යුතු තවත් කරුණකි. එසේ නම් 1934 දී "සත්ව සන්තතිය" ප්‍රකාශයට පත් වීමේ සිට 1974 දී "මානව විද්‍යාව හා සංස්කෘතිය" ප්‍රකාශයට පත්වීම දක්වා අවුරුදු 40 ක තරම් දිගු කාලයක් තුළ ම මානව විද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන සිංහල පමණක් දත් බුද්ධිමතුන් සඳහා මාර්ටින් වික්‍රමසිංහගේ කෘති විපුල මෙහෙයක් සැලසූ බව යළිත් අවධාරණය කරනු වටී.

මාර්ටින් වික්‍රමසිංහගේ මානව විද්‍යාත්මක විවරණ අතර කැපී පෙනෙන්නේ සංස්කෘතිය පිළිබඳව කරනු ලැබූ විග්‍රහයන් බව ඉහත පෙන්වා දී ඇත. එසේ නම් ඔහු වඩාත් කැප වී ඇත්තේ සංස්කෘතික මානව විද්‍යාව වෙනුවෙනි. සිංහලයන්ගේ සංස්කෘතිය පිළිබඳව ඔහු

පලකළ අදහස් කාලීන වශයෙන් විචාරයට ලක්විය යුතු ඒවා බව පිළිගැනීමට සිදුවේ. එමෙන්ම ඌන සංවර්ධිත රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති නිර්ණය කිරීමේදීත්, ඒවා ක්‍රියාත්මක කිරීමේදීත්,අපට ආවේණික පවතින සමාජ හා සංස්කෘතික ප්‍රශ්න පිළිබඳ පූර්ව අවබෝධයක් පැවතිය යුතුවේ. මානව විද්‍යාත්මක දෘෂ්ටියකින් යුතුව ලාංකික සමාජය තේරුම් ගැනීමට වෑයම් කිරීමෙන් මේ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පමණක් නොව එම ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් කවරේදැයි දැන ගැනීමටද ඉඩ ප්‍රස්ථාව ඇතිවේ. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ සංස්කෘතික විවරණ රැසකම මෙම අදහස දක්නට ලැබීම ඉතා වැදගත්ය.එහෙත් සංස්කෘතියට සම්බන්ධ ගැඹුරු සංකල්ප විග්‍රහ කිරීමට යාමේ දී සංස්කෘතික මානව විද්‍යාඥයෙකුට වඩා සංස්කෘතික විචාරයෙකුගේ සවරූපයට ඔහු පත්ව ඇති බවත් හැඟේ. එහෙත් ඔහුගේ විචාරය, මානව විද්‍යාවේ විෂය සීමාවෙන් බැහැරව ලිස්සා ගොස් ඇතැයි එක්වරම පිළිගැනීමට කරුණු නැත. තමා රැස් කළ කරුණු න්‍යායාත්මකව ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විශ්ලේෂණයට වඩා විචාරයට බර වූයේ ද තමාගේ සංස්කෘතිය අනෙක් බොහෝ සංස්කෘතින්ට වඩා උසස්ය යන මානව කේන්ද්‍රවාදී අදහස් කැටි කර ගත් සීමාන්තික ස්ථරයක ඔහුගේ විචාරය සිරවී පැවතුනේ ද යන්න තව දුරටත් විමසුමට ලක් විය යුතුය. කෙසේ වුවද මානව විද්‍යාව පිළිබඳව බොහෝ දෑ ඇසූ, බොහෝ දෑ කියූ, බොහෝ දෑ සෙවූ, මාර්ටින් වික්‍රමසිංහයන් ඒ සියල්ලම ක්‍රමානුකූලවත්, න්‍යායාත්මවත්, ගොනු කර ගැනීමට අවශ්‍ය වූ සෛද්ධාන්තික මානව විද්‍යා දැනුමක් ලබා සිටියේ නම් ශ්‍රී ලංකාවේ මානව විද්‍යාව පිළිබඳ ඔහුගේ සටහන් අමරණීය ලේඛන බවට පත් වන්නට ඉඩ තිබිණ.

# ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


| | |
|---|---|
| අමුණුගම, සරත් | සංස්කෘතිය සමාජය හා පරිසරය, සදීපා පොත්හල, කොළඹ, 1999. |
| අබේවික්‍රම, රන්ජිත්, ඇල් | තුන් කල් විනිවිද දුටු ප්‍රාඥයා, මල්පියලි ප්‍රකාශන, දංකොටුව, 2002. |
| පීරිස්, රැල්ප් | සිංහල සමාජ සංවිධානය, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව, 2005. |
| බ්‍රෝහියර්, ආර්, එල් | ලක්දිව පුරාතන වාරිමාර්ග (පළමුවන කොටස) පරිවර්තන, එල්. පියසේන, ලංකාණ්ඩුවේ මුද්‍රණ ලෙදාර්තමේන්තුව, 1969. |
| පරණවිතාන, සෙනරත් | සිංහලයෝ, විසිදුනු ප්‍රකාශන, බොරලැස්ගමුව, 1998. |
| වික්‍රමසිංහ, මාර්ටින් | සිංහල ලකුණ, සරස, රාජගිරිය, 2006. |
| වික්‍රමසිංහ, මාර්ටින් | සිංහල සකස්කඩ, සමන් ප්‍රකාශන, මහරගම, 1962. |
| වික්‍රමසිංහ, මාර්ටින් | සිංහල සාහිත්‍යයේ නැඟීම, සමන් ප්‍රකාශන, මහරගම, 1959. |
| වික්‍රමසිංහ, මාර්ටින් | මානව විද්‍යාව හා සිංහල සංස්කෘතිය, සරස, රාජගිරිය, 2007. |
| ස්වර්ණසිංහ, කේ. එම්. අයි | අපේ වැවෙන් පැන් දෝතක්, චාපා ප්‍රකාශන, පන්නිපිටිය, 2005. |
| විතානගේ, ඉන්දික | හාස්කමෙන් පිරි සිංහල වැව, චාපා ප්‍රකාශන, පන්නිපිටිය, 2004. |
| සුරවීර, ඒ. වී | අනුරාධපුර සංස්කෘතිය, සමන් ප්‍රකාශන, මහරගම, 1962. |
| සිරිවීර, ඉන්ද්‍රකීර්ති | ශ්‍රී ලාංකේය ඉතිහාස තරංග, ආරිය ප්‍රකාශන, වරකාපල, 2004. |

විමලවංශ හිමි, බද්දේගම අපේ සංස්කෘතිය, සමයවර්ධන, කොළඹ, 2000

විමලවංශ හිමි, බද්දේගම, හෙළ හැදියාව, සමයවර්ධන, කොළඹ, 1996.

සෙනවිරත්න, අනුරාධ, පුරාණ සිංහල වාරි සංස්කෘතිය, ඇස්. ගොඩගේ, කොළඹ, 2001.

**මහාචාර්ය දයා අමරසේකර**
**සමාජ විද්‍යා අංශය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**